# බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2013 (2014)

## (02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

කාලය පැ. 3 යි.

( I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

I කොටස

01. (i) සිට (vii) තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

i. අ). ක්‍රි. පූ. 6 වන සියවස පමණ කාලයෙහි ඍෂිවරුන් හෝ මුනිවරුන් නමින් උත්තර භාරතයේ සිටි පිරිස (බ්‍රාහ්මණ/ ශ්‍රමණ) සමාජයට අයත් වෙයි.

ආ). පස්වග තවුසන් විසින් බුදු බව ලබාගැනීමේ දී එකම මාර්ගය (මධ්‍යම ප්‍රතිපදාව/ අත්තකිලමථානු යෝගය) තුළින් වැටී ඇති බව විශ්වාස කරන ලදී.

ii. අ.) බුද්ධ කාලයේ විසූ භික්ෂූන් වහන්සේලා විසින් ප්‍රව්‍රජ්‍යාපේක්ෂක කු-ල පුත්‍රයන් ඒ ඒ දිසාවල දී, ජනපදවල දී පැවිදි කරන ලද්දේ (එහි භික්ඛු / සරණාගමන) පැවිද්දෙනි.

ආ) (සිඟමනෙන් ජීවත් වන දුප්පතුන්/ ණයකරුවන්) පැවිදි නොකළ යුතු බව විනයෙහි දැක්වෙයි.

iii. අ) (බොරු කියන/ නිතර නිදන සුළු) සාමණේර භික්ෂුව සිවුරු හරවා යැවිය යුතු බව විනයෙහි දැක්වේ.

ආ) යම් සාමණේර භික්ෂුවක් වයස අවුරුදු (දහ අට/ විස්ස) සම්පූර්ණ කොට නොමැති නම් උපසම්පදා කරනු නො ලැබේ.

iv. අ) බුදුරජාණන් වහන්සේ විනය නීති පනවන ලද්දේ අලජ්ජට අසංවර, ආපත්ති බහුල පැවිද්දන් (සසුනින් නෙරපා හැරීමටයි./ ආයති සංවරයෙහි පිහිටුවීමටයි.)

ආ) සංඝ සමාජයේ අන්‍යෝන්‍ය සමගියට සුහදත්වය ඇතිකොට එමගින් පාරිශුද්ධිය ප්‍රගුණකර ගැනීම (පවාරණ විනය කර්මයෙහි / කඨින චීවර පූජාවේ) අරමුණයි.

v. අ). පබ්බජනීය කම්ම යනු (කුසල කර්මවල ප්‍රභේදයකි/ අනාචාර භික්ෂුවකට පනවන දඬුවමකි)

ආ) සිඟාලෝවාද සූත්‍රාගත චතුර්විධ කර්ම ක්ලේශයන්ට අයත් නොවන්නේ, (බොරු කීමයි/ සුරා පානයයි.)

vi. අ) ක්ෂත්‍රිය වංශයේ ඉපදීමත්, බුදුරදුන්ගේ ඥාතීත්වයත් (ලකුණ්ටක/ ථුල්ලතිස්ස) තෙරුන්ගේ උඩඟුකමට බලපෑ බව ධම්ම පද නිදාන කථාවක දැක්වෙයි.

ආ) ආමිසයෙන් උපකාර කරන ගිහියාට භික්ෂුවක විසින් (ධර්ම/ අභය) දානයෙන් උපකාර කළ යුතු බව සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් වෙයි.

vii. අ) බුදුරජාණන් වහන්සේ සත්තිගුම්භ ජාතකය දේශනා කරන ලද්දේ (දෙව්දත් තෙරුන්/ මව පෝෂණය කරන භික්ෂුව) අරභයායි

ආ) වැඩියෙන් ඉල්ලීම නිසා අප්‍රිය කෙනෙකු බවට පත්වන බව කියැවෙන ජාතක කථාව (මහා කපි/ මණි කණ්ඨ) ජාතකයයි.



Scanned by CamScanner

viii. සිංහලයට නගන්න.

ආ). 'අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ'

.............................................................................................................

.............................................................................................................

ආ) 'අන්ධකාරෙන ඔනද්ධා - පදීපං න ගවෙස්සථ'

.............................................................................................................

.............................................................................................................

ix. පහත සඳහන් අදහස ඇති ධම්මපද ගාථා ලියන්න.

අ). පෘථග්ජන පුද්ගලයා යම් තැනක නො ඇලේද එම වන පෙදෙස සිත්කලුය. එහි රාගය නැසූ රහතන් වහන්සේලා ඇලෙන්නා හ. උන්වහන්සේලා කම් සැප නොසොයති.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

ආ). කුශලයෙහි යුහුසුළු විය යුතුය. සිත පවින් වැළකිය යුතුය. අලසව පින් කරන්නා ගේ සිත පවෙහි ඇලෙයි.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

x. " අ " කොටසේ යෙදුමට ගැළපෙන යෙදුම " ආ " කොටසෙන් තෝරා හිස්තැන් තුළ ලියන්න.

| " අ " | | "ආ" |
|---|---|---|
| තිත්තිර බ්‍රහ්මචරිය | .................................................... | කර්මක්ලේශයකි. |
| සත්තිගුම්බ ගිරවා | .................................................... | මෙලොව දියුණුවට හේතු වේ. |
| පහන් දැල්වීම. | .................................................... | අසත් පුරුෂ සේවනයයි. |
| සමජීවිකතා | .................................................... | වැඩිහිටියන්ට ගරු කිරීමයි. |
| අර්ථ චරියාව | .................................................... | උපොසථ ක්‍රියා පිළිවෙළකි. |
| අදත්තාදාන | .................................................... | සංග්‍රහ වස්තුවකි. |



Scanned by CamScanner

002219



## 2558 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2013 (2014)

### (02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

**S 2**

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

### II කොටස

**2.** (i) බුදුරජාණන් වහන්සේගේ පළමු ධර්මදූත පිරිසට අයත් භික්ෂු පිරිස ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ධර්මදූත සේවය සඳහා නික්ම ගිය පළමු කණ්ඩායමට බුදුරජාණන් වහන්සේ කළ අනුශාසනාව ලියන්න. *(ලකුණු 06 යි)*

(iii) මජ්ඣිම නිකායේ කකචූපම සූත්‍රයේ දැක්වෙන පරිදි "එක් කලෙක භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ සිත සතුටු කළ බවත්, යමක් සිහි ගන්වනු විනා දිගින් දිගට ම අනුශාසනා කිරීම අවශ්‍ය නොවූ බවත් ප්‍රකාශ කෙරේ." මේ කරුණ පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

**3.** (i) සිගාලෝවාද සූත්‍රයෙහි අන්තර්ගත විෂය කරුණු දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ආර්ය ශ්‍රාවකයා විසින් ආවරණය කරනු ලබන සදිසා සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් වන ලෙස ලියා දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) මනා අඹුසැමි සබඳතාවක් පවත්වාගැනීමේ අවංක චේතනාව ඇති සැමියෙකු තුළ තිබිය යුතු ලක්ෂණ තුනක් සිගාලෝවාද සූත්‍රය ඇසුරින් පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

**4.** (i) ශරීරයෙහි අනිත්‍යතාව දැක්වෙන ධම්මපද ගාථාවක් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) එම ගාථාවට අයත් ධර්ම කරුණු විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "සිත් ගන්නා උපමා මගින් ධර්ම කරුණු පහදා දීම ධම්මපදයෙහි ඇති විශේෂත්වයකි." පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

**5.** (i) සිංහලට නගන්න.

(අ) තෙන හි ගහපතිපුත්ත සුණාහි සාධුකං මනසි කරොහි.

(ආ) චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති.

(ඉ) දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා

(ඊ) අථ ඛො ධම්මිකො උපාසකො පඤ්චහි උපාසක සතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසංකමි. *(ලකුණු 08 යි)*

(ii) මෙම වාක්‍ය පාලියට නගන්න.

(අ) පෙර දඹදිව බිම්බිසාර නම් රජ කෙනෙක් රාජ්‍යය කරවීය.

(ආ) යහපත් වචන කථාකිරීම මංගල කරුණකි.

(ඉ) වෛරයෙන් වෛරය කිසි කලෙකත් නොසංසිඳේ.

(ඊ) සියලු සත්වයෝ සුවපත් වෙත්වා !

(උ) මම බුදුන් වැඳීමට විහාරයට යමි.

*(ලකුණු 10 යි)*

**6.** (i) මෙම පාඨය සිංහලට නගන්න.

"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා, කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි." *(ලකුණු 08 යි)*

(ii) පරාභව සූත්‍රාගත පුද්ගල පරිහානියට හේතුවන කරුණු පහක් දක්වා ඒවා සමාජ පරිහානිය ඇතිකරන අයුරු පෙන්වා දෙන්න. *(ලකුණු 10 යි)*

**7.** (i) මෙම පාඨය සිංහලට නගන්න.

"තදා පන ධම්ම සභායං කථං සමුට්ඨාපෙසුං. ආවුසො සම්මා සම්බුද්ධො ඤාතකානං අත්ථං චරතීති. සත්ථා ආගන්ත්වා කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නාති පුච්ඡිත්වා ඉමාය නාමාය වුත්තෙ න භික්ඛවෙ ඉදානෙව පුබ්බෙපි තථාගතො ඤාතීනං අත්ථං චරතෙවාති වත්වා අතීතං ආහරි. *(ලකුණු 08 යි)*

(ii) සැබෑ නායකයෙකු තුළ තිබිය යුතු නායකත්ව ලක්ෂණ මහාකපි ජාතකය ඇසුරින් පහදා දෙන්න. *(ලකුණු 10 යි)*

***

Scanned by CamScanner